**උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ , පළාත් ආදායම් සේවයේ II වන ශ්‍රේණියේ බඳු නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025**

**සංශෝධන දැන්වීම**

2025.09.25 දින දිනමිණ, තිණකරන් හා ඩේලි නිවුස් පුවත්පත් මඟින් ප්‍රසිද්ධ කරන ලද උක්ත දැන්වීමේ අංක 02 හා 11 ජේද පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

02. වයස-

"අයදුම්කරුගේ වයස ඉල්ලුම්පත්‍රය භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය. (දැනට රාජ්‍ය සහ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව අවුරුදු 35කි)."

11. මෙම නිවේදනයේ සඳහන් කර ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, නියමිත පරිදි ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් හට සහතිකපත්‍ර පරීක්ෂා කිරීමකින් තොරව තරඟ විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. තරඟ විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට වූ පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක් දරන නිලධාරියෙකු අයදුම්කරුවෙකු වන්නේ නම් ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය තමා සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මඟින් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුය. එසේ ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.